PAUL RATNAYEKE ASSOCIATES
ATTORNEYS-AT-LAW
COLOMBO

SERVICE COPY

**කොළඹ දිසා අධිකරණයේදීය**

නිහාල් ශ්‍රී අමරසේකර
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**පැමිණිලිකරු**

නඩු අංකය:19849/එම්.ආර්
ස්වභාවය: මුදල්
කාර්ය පරිපාටිය: සාමාන්‍ය
වටිනාකම: රු.300,000,000/-

- එදිරිව -

ගාමිණී ලක්ෂ්මන් පීරිස්
"විසුම්පාය",
ස්ටේපල්ස් වීදිය,
කොළඹ 02. සහ
37, කිරුළ පෙදෙස,
කොළඹ 05.

**විත්තිකරු**

වර්ෂ 1997 ක්වූ ඔක්තෝම්බර් මස 31 වෙනි දිනදීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ***"පෝල් රත්නායක ඇසෝසියේට්ස්"*** යන නාමය අභිධානය හා විලාශය යටතේ හවුලේ නීතිඥ වෘත්තියේ කටයුතු කරනු ලබන නීතිඥවරුන් වන ජේම්ස් හෙන්රි පෝල් රත්නායක සහ උස්වත්ත ලියනගේ සුදත් නිලුපුල් ප්‍රසන්ස පෙරේරා සහ ඔවුන්ගේ සහයක නීතිඥවරුන් වන පුණ්‍යකාන්ති නවරත්න මෙනෙවිය, ශලින්ද්‍ර ජයසිංහ මහත්මිය, ඉන්ද්‍රාලෝජිනි රාජගෝපාලන් මෙනෙවිය, චන්ද්‍රානි සූර්යආරච්චි මෙනෙවිය, කෝලිත සුසන්ත බණ්ඩාර විජේරත්න මහතා සහ ෂෙනුකා ධුෂානි වික්‍රමසිංහ මෙනෙවිය මගින් පෙනී සිටින ඉහත නම සඳහන් විත්තිකරුගේ ***උත්තරයෙන්*** මෙසේ ප්‍රකාශ කර සිටී :-

1. මෙහි මින්මතු ප්‍රකාශිතව පිළිගෙන ඇති ප්‍රකාශ හැර පැමිණිල්ලේ අඩංගු සියළු හා එක් එක් ප්‍රකාශ විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. පැමිණිල්ලෙන් මෙම විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් අනාවරණය නොවන බව විත්තිකරු නිශ්චිතවම කියා සිටී.

3. පැමිණිල්ලේ මුහුණත අනුව මෙම විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් පැමිණිල්ලෙන් අනාවරණය නොවන නිසා පැමිණිල්ල **ප්‍රමාද දෝෂයකින්** භාරගෙන ඇති බව ද මේ නිසා පැමිණිල්ල ප්‍රතික්ෂේප කළ යුතු බව සහ/හෝ නඩුව **ආරම්භයේදීම නිෂ්ප්‍රභා කළ යුතු** බව ද විත්තිකරු ප්‍රකාශ කරයි.

4. බාහිර කාර්ය සඳහා මෙම නඩුව පවරා ඇති නිසා එය අධිකරණයේ ක්‍රියාවලිය අයථා ලෙස යොදා ගැනීමක් වන බව ද මෙම නඩුවේ කාර්ය සඳහා අදාළ නොවන සහ අවශ්‍ය නොවන පැමිණිල්ලේ ඇති ප්‍රකාශ වලට පුවත්පත් කීපයක පුළුල් ප්‍රසිද්ධියක් ලබාදීම මීට තවදුරටත් සාක්ෂි දරණ බව ද විත්තිකරු ප්‍රකාශ කරයි.

5. මෙම නඩුව පැවරීම **අසත්භාවී** බව ද අධිකරණයේ ක්‍රියාවලිය **අයථා පරිදි යොදා ගැනීමක් බව** ද වින්තිකරු ප්‍රකාශිතවම කියා සිටී. ද්වේශ සහගත ලෙස සිවිල් නඩු කටයුතු පැවරීම සම්බන්ධයෙන් නඩු පැවරීමේ ද පැමිණිලිකරුගෙන් අලාභ ඉල්ලා සිටීමේ ද ස්වකීය අයිතිය විතිත්කරු විසින් ඉතිරි කර ගනු ලැබේ.

6. කෙසේ වුවද මෙම නඩුවේ දී හිමිකම් පා ඇති අලාභ විත්තිකරුගේ නිල තත්ත්වයෙන් කරන ලදැයි කියන ක්‍රියා සඳහා බව ද මේ නිසා විත්තිකරුගේ පෞද්ගලික තත්ත්වයෙන් විත්තිකරුට විරුද්ධව මේ නඩුව පවත්වාගෙන යාම පැමිණිලිකරු විසින් කළ නොහැකි බව ද මේ අනුව පැමිණිලිකරුගේ නඩුව ආරම්භයේ දීම නිෂ්ප්‍රභා කළ යුතු බව ද විත්තිකරු කියා සිටී.

7. පැමිණිල්ල අනවශ්‍ය විස්තරවලින් ගහන බව ද ඒ නිසා නිශ්චිතව සඳහන් කිරීම අවශ්‍ය නොයෙකුත් විස්තර නිවැරදිව සහ අනවශ්‍ය විස්තර වලින් තොරව පැමිණිල්ලේ ප්‍රකාශ නොවේ නම් එවැනි පැමිණිල්ලක් අධිකරණය විසින් භාර ගැනීම **ප්‍රතික්ෂේප කළ යුතු බව ප්‍රකාශිතවම ප්‍රකාශ කෙරෙන සිවිල් නඩු විධාන සංග්‍රහයේ 462(අ) වගන්තිය** අනුව පැමිණිල්ල භාර ගැනීමට අධිකරණය ප්‍රතික්ෂේප කල යුතු යැයි ද විත්තිකරු ප්‍රකාශ කර සිටී. එම නිසා අධිකරණය විසින් දැන් පැමිණිල්ල භාර ගැනීම ප්‍රතික්ෂේප කල යුතුය සහ/හෝ නඩුව නිෂ්ප්‍රභා කල යුතුය.

8. වෙනත් දේ අතර,

i පැමිණිල්ල අනවශ්‍ය විස්තරවලින් ගහණ නිසා ද,

ii පැමිණිල්ල **සිවිල් නඩු විධාන සංග්‍රහයේ 40(ඇ) වගන්තියට** අනුකූල නොවන නිසා ද,

පැමිණිල්ල සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධානාත්මක විධි විධානවලට අනුකූල නොවන බව විත්තිකරු ප්‍රකාශ කරයි.

9. පැමිණිල්ලේ 1වන ජේදයට පිළිතුරු දෙන විත්තිකරු මෙම අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බලසීමාව ඇතුළත ඔහුගේ පදිංචිය පිළිගන්නා නමුත් විත්තිකරුට විරුද්ධව නඩු පැවරීම සඳහා පැමිණිලිකරුට නඩු නිමිත්තක් උද්ගත වී ඇතැයි යන්න නිශ්චිතව ප්‍රතික්ෂේප කරයි.

10. එකී අවස්ථාක විත්තිකරු මුදල් අමාත්‍යාංශයේ උපදේශක වී සිටි බව හැර පැමිණිල්ලේ 2(අ) සහ 2(ආ) ජේද වල අඩංගු ප්‍රකාශ ගැන විත්තිකරු නොදනී. මේ අවස්ථාගත කරුණු අනුව, ඉහත සඳහන් කරුණු වලට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 2(අ) සහ 2(ආ) ජේදවල අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

11. පැමිණිල්ලේ 3වන ජේදයට පිළිතුරු දෙන විත්තිකරු එකී ප්‍රකාශ මේ නඩුවේ කාර්ය සඳහා අදාළ නොවන බව ප්‍රකාශ කරන නමුත් විත්තිකරු කලින් ආණ්ඩුවට ඉතා කිට්ටු සම්බන්ධතාවයකින් සිටි බව හැර ඒවා පිළිගනී.

12. විත්තිකරු පැමිණිල්ලේ 4(අ) ජේදය පිළිගනී.

13. පැමිණිල්ලේ 4(ආ) ජේදයට පිළිතුරු දෙන විත්තිකරු, පැමිණිලිකරු විසින් කොළඹ දිසා අධිකරණයේ අංක.3155/විශේෂ දූෂණ නඩුව පැවරූ බව දන්නා නමුත් අංක.3155/විශේෂ නඩුව ව්‍යුත්පන්න නඩුවක් වශයෙන් පවරන ලද්දේය යන කාරණයට යටත්ව එහි අඩංගු අනෙකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

14. පැමිණිල්ලේ 4(ඇ) ඡේදයට පිළිතුරු දෙන විත්තිකරු වැලැක්වීමේ ආඥා නිකුත් කළ බව පිළිගන්නා නමුත් වාරණ නියෝගයේ නියමයන් වලට සහ එකී නඩුවේ අඩංගු කරුණු වලට යටත්ව එහි අඩංගු අනෙකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

15. අංක.3155/විශේෂ දරණ කොළඹ දිසා අධිකරණයේ නඩුවේ අඩංගු කරුණු වලට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 5වන, 6වන සහ 7වන ඡේදවල අඩංගු ප්‍රකාශ ගැන නොදන්නා අතර ඒ නිසා ඒවා ප්‍රතික්ෂේප කරයි.

16. පැමිණිල්ලේ 8 වන ඡේදයට පිළිතුරු දෙන විත්තිකරු එච්.ඩී.එල්. සමාගම ලැයිස්තුගත පොදු සමාගමක් බව ද එමනිසා එය කොළඹ කොටස් හුවමාරු පොළේ සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ රීතිවලින් පාලනය වන බව ද පමණක් පිළිගනී. විත්තිකරු 1987.10.23 සිට 1994.10.31 දක්වා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයකු වූ බව හැර පැමිණිල්ලේ 8(අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේද වල අඩංගු අනෙකුත් ප්‍රකාශ විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. විත්තිකරු පැමිණිල්ලේ 9, 10 සහ 11 වන ඡේද වල අඩංගු ප්‍රකාශ ගැන නොදන්නා අතර ඒ නිසා ඒවා ප්‍රතික්ෂේප කරයි.

18. පැමිණිල්ලේ 12(අ) ඡේදයට පිළිතුරු දෙන විත්තිකරු පොදුජන පෙරමුණ එහි මැතිවරණ ව්‍යාපාරයේ කොටසක් වශයෙන්, වංචාව හා දූෂණය පිළිබඳ වෙනත් කරුණු අතර විමර්ශණය කිරීමට අවශ්‍ය ප්‍රශ්ණයක් වශයෙන් "හිල්ටන් කාරණය" යොදාගෙන තිබුණු බව පිළිගනී. පැමිණිල්ලේ 12වන ඡේදයේ අනෙකුත් ප්‍රකාශවලට පිළිතුරු දෙන විත්තිකරු අධිකාර (වොරන්ට්) පත්‍රයේ උපලේඛණයේ ලැයිස්තුගත කර ඇති මහජන ආයතනවල කටයුතු විමර්ශණය කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිහිට වූ බව ද ඇත්ත වශයෙන් එච්.ඩී.එල්. සමාගමේ සමහර අධ්‍යක්ෂවරුන්ට හේතු පෙන්වීමේ දැන්වීම් නිකුත් කර තිබූ බව ද පිළිගනී. ඉහත කී කරුණු වලට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 12වන ඡේදයේ අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

19. විත්තිකරු පැමිණිල්ලේ 13(අ) ඡේදයේ අඩංගු ප්‍රකාශ ගැන නොදනී.

20. පැමිණිල්ලේ 13(ආ) සිට 13(ඉ) දක්වා වූ ඡේද වලට පිළිතුරු දෙන විත්තිකරු සමථයේ අඩංගු දේ පිළිගන්නා අතර සමථය සමස්ථයක් වශයෙන් කියවිය යුතු බව නැවතත් ප්‍රකාශ කරයි. සමථය ඇති කරගත හැකිවූයේ පැමිණිලිකරුගේ දැඩි සහ නොපසුබස්නා උත්සාහය නිසාය යන්න විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

21. විත්තිකරු පැමිණිල්ලේ 14(අ), (ආ) සහ (ඇ) යන ඡේද වල අඩංගු ප්‍රකාශ ගැන නොදන්නා අතර ඒ නිසා ඒවා ප්‍රතික්ෂේප කරයි. විත්තිකරු පැමිණිල්ලේ 14(ඇ) ඡේදයේ අඩංගු ප්‍රකාශ නිශ්චිතවම ප්‍රතික්ෂේප කරයි.

22. පැමිණිල්ලේ 15 වන ඡේදයට පිළිතුරු දෙන විත්තිකරු ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳ වූ බව ද විදේශ අමාත්‍යවරයා, සංචාරක අමාත්‍යවරයා, ජපන් තානාපතිවරයා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සාකච්ඡාවට පැමිණ සිටි බව ද විත්තිකරු සාකච්ඡාවේ මූලාසනය දැරූ බව ද පිළිගනී.

23. පැමිණිලිකරු විසින් විත්තිකරුට අනාවරණය කරන ලද තොරතුරු පදනම් කරගෙන විත්තිකරු එකී සාකච්ඡාවේ දී ප්‍රකාශයක් කළ බව විත්තිකරු නිශ්චිතවම ප්‍රකාශ කරයි. ඉහත කී කරුණු වලට යටත්ව සහ එකී සාකච්ඡාවේ දී ප්‍රකාශ කරන ලද කරුණු වලට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 15 වන ජේදයේ අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

24. පැමිණිල්ලේ 16 වන ජේදයට පිළිතුරු දෙන විත්තිකරු, " ද අයිලන්ඩ් " පුවත්පතේ **"ඒ1ඒ"** යනුවෙන් ලකුණු කළ පළකිරීම පිළිගනී. ඉහත කී කාරණයට යටත්ව විත්තිකරු එකී ජේදයේ අඩංගු අනෙකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

25. පැමිණිල්ලේ 17(අ) සහ 17(ආ) ජේදවලට පිළිතුරු දෙන විත්තිකරු **"ඒ2ඒ"** සහ **"ඒ2බී"** ලිපි ඒවායේ නම් කරන ලද තැනැත්තන්ට සංනිවේදනය කරන ලද බව පිළිගනී.

26. 17(ඇ) ජේදයට පිළිතුරු දෙන විත්තිකරු 1995 ජුලි මස 25 වන දින "ඩේලි නිව්ස්" පුවත්පතේ එහි සඳහන් ප්‍රකාශය පළ වූ බව පිළිගනී. ඉහත කී කාරණයට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 17 වන ජේදයේ අඩංගු අනෙකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

27. පැමිණිල්ලේ 18 සහ 19 වන ජේදවල අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

28. එම දිනවල හැන්සාඩ් වාර්තාවේ අඩංගු දෙයට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 20, 21 සහ 22 වන ජේදවල අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරන අතර කෙසේ වුවද **පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශ වලට පරම වරප්‍රසාද හිමිවන බව ප්‍රකාශ කරයි.**

29. පැමිණිල්ලේ 23 වන ජේදයට පිළිතුරු දෙන විත්තිකරු හැන්සාඩ් වාර්තාවේ අඩංගු දේට යටත්ව **එකී ජේදයේ අඩංගු අනෙකුත්** ප්‍රකාශ ප්‍රතික්ෂේප කරන අතර කෙසේ වුවද පාර්ලිමේන්තුවේ කරන ලද එකී ප්‍රකාශ වලට පරම වරප්‍රසාද හිමිවන බව කියා සිටී.

30. අංක.3231/විශේෂ දරණ නඩුව පැවරීම හැර පැමිණිල්ලේ 23(ආ) ජේදයේ අඩංගු ප්‍රකාශ ගැන විත්තිකරු නොදනී. විත්තිකරු පැමිණිල්ලේ 23(ඇ) ජේදයේ අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

විත්තිකරු පැමිණිල්ලේ 23(ඈ) සහ 23(ඉ) ජේදවල අඩංගු ප්‍රකාශ ගැන නොදන්නා අතර ඒ නිසා ඒවා ප්‍රතික්ෂේප කරයි.

31. පැමිණිල්ලේ 24(අ) සහ (ආ) ජේදවලට පිළිතුරු දෙන විත්තිකරු අමාත්‍ය මණ්ඩලය විසින් සුමස්ථ ජාතික යහපත සඳහා, වෙනත් දේ අතර, වාස්තු විද්‍යාඥයන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට කරන ගෙවීම්වලට අදාළ වන එකී 1වන සහ 2වන ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව ප්‍රකාශ කරයි. 24 වන ජේදයට වැඩිදුරටත් පිළිතුරු දෙන විත්තිකරු එකී සම්මතය අනුව ගෙවීම් කරන ලද බව ප්‍රකාශ කරයි.

32. ඉහත කී කරුණු වලට යටත්ව සහ අමාත්‍ය මණ්ඩලය විසින් එකඟවන ලද සම්මතයට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 24 වන ජේදයේ අඩංගු අනෙකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

33. පැමිණිල්ලේ 25 වන ජේදයට පිළිතුරු දෙන විත්තිකරු පැමිණිලිකරුගෙන් නීතිඥවරයාගෙන් එන්තරවාසියක් ලැබුණ බව පිළිගනී. එකී එන්තරවාසියේ අඩංගු දේ සිද්ධිමය වශයෙන් නිවැරදි යැයි විත්තිකරු පිළි නොගන්නා අතර ඒ අනුව පැමිණිල්ලේ 25 වන ජේදයේ අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

34. පැමිණිල්ලේ 26 වන ජේදයට පිළතුරු දෙන විත්තිකරු පැමිණිලිකරුගෙන් **සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වන වගන්තිය** යටතේ සහ ඒ අනුව උද්දේශිත දැන්වීමක් පිළිගනී. විත්තිකරු පැමිණිල්ලේ 26 වන ජේදයේ අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

35. විත්තිකරු පැමිණිල්ලේ 27 වන ඡේදයේ අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

36. ඉහත කී කරුණු වලට යටත්ව විත්තිකරු පැමිණිල්ලේ 1- 27 දක්වා ඡේද වල අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

37. කෙසේ වුවද ඉහත කී කරුණු වලට හානියක් නොමැතිව ද විත්තිකරු ප්‍රකාශ කරන්නේ, සඳහන් කරන ලද උද්දේශිත පළ කිරීම සත්‍ය වූ නිසා සහ මහජන යහපත සඳහා පළ කරන ලද නිසා එය යුක්ති සහගත බවය.

38. කෙසේ වුවද එමෙන්ම ඉහත කී කරුණු වලට හානියක් නොමැතිව ද විත්තිකරු ප්‍රකාශ කරන්නේ උද්දේශිත පළ කිරීම වරප්‍රසාද ලත් පළ කිරීමක් බවයි.

39. කෙසේ වුවද එමෙන්ම ඉහත කී කරුණු වලට හානියක් නොමැතිව ද විත්තිකරු කියා සිටින්නේ සියළු හා වැදගත් කාලවල දී ඔහු නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ බවයි.

40. කෙසේ වුවද එමෙන්ම ඉහත කී කරුණු වලට හානියක් නොමැතිව ද විත්තිකරු ප්‍රකාශ කරන්නේ පැමිණිල්ලේ සඳහන් "ඩේලි නිව්ස්" පුවත්පතේ පළකිරීම ගරු ජනාධිපතිනිය විසින් කරන ලද විධානය අනුව කරන ලද බවත් ඒ අනුව කෙසේවත් පැමිණිලිකරු විසින් මෙම නඩුව මෙම විත්තිකරුට විරුද්ධව පවරා පවත්වාගෙන යා නොහැකි බවත් ය.

**එම නිසා** විත්තිකරු අයැද සිටින්නේ -

(අ) පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභා කරන ලෙසත්,

(ආ) ගාස්තු ප්‍රදානය කරන ලෙසත්,

(ඇ) මෙම අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන සලසා දෙන ලෙසත්ය.

Sgd; Paul Ratnayeke Associates

**විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**